
| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| **7 ශ්‍රේණිය** | **චිත්‍ර කලාව - I/ II** |

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 2 යි

**I කොටස**

**සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

✶ **අංක 01 සිට 05 තෙක් පහත දැක්වෙන රූපසටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01) ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ ........................................ නම් සිතුවමයි.

02) මෙය ..................................... යුගයට අයත් යැයි සැලකේ.

03) 1919 දී ................................. මහතා විසින් සොයා ගන්නා ලද මෙම ලෙනෙහි සත්ව, මානව රූපවලට අමතරව ඉර හඳ දැක්වෙන චිත්‍ර සටහනක් ද ඇත.

04) මෙහි චිත්‍ර .................................හා ................................... යන ක්‍රම දෙකටම අඳින ලද ඒවා වේ.

05) .................................. නම් ලෙනෙහි මෙය දක්නට ඇත.

✶ **අංක 06 සිට 10 තෙක් දී ඇති වාක්‍ය හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06) අභයගිරි ස්තූපයට පිවිසෙන දොරටුව දෙපස සංඛ නිධි හා පද්ම නිධි යනුවෙන් මුරගල් දෙකක් ඇත. (    )

07) තෙළීමේ දී අනවශ්‍ය කොටස් ඉවත් කිරීම මගින් මූර්තියක් නිර්මාණය කරයි. (    )

08) රූපවාහිනී මාධ්‍යය තුළ නූල් රූකඩ හා සෙවනැලි රූකඩ ඉතා ජනප්‍රිය වී ඇත. (    )

09) සරල හා වියුක්ත හැඩතල සහිත නිර්මාණය කරන ලද රූප පරිගණක තාක්ෂණයෙන් සජීවීකරණයට ලක්කිරීමෙන් කාටූන් නිර්මාණය කරනු ලැබේ. (    )

10) නෙළුම් මල් මෝස්තරය උද්භිද මෝස්තර ගණයට අයත් වේ. (    )

✶ **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති රූප සටහන් නම් කරන්න.**

11) 


…………………………

12) 


…………………………

13) 

…………………………

14) 

…………………………

15) 

…………………………

✶ **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍යය බැගින් තනන්න.**

16) හර්මිකාව ……………………………………………………………………………………

17) මූලික වර්ණ ……………………………………………………………………………………

18) අත් රූකඩ ……………………………………………………………………………………..

19) වටදාගෙය ……………………………………………………………………………………

20) පර්යාවලෝකය ……………………………………………………………………………………

✶ **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

21) රුවන්වැලි මහා සෑයේ ගර්භයේ හැඩය වනුයේ කුමක් ද?

1) බුබ්බුලාකාර 2) ධාන්‍යාකාර 3) අම්ලාකාර 4) ඝන්ඨාකාර

22) ස්තූපයක ආරක්ෂාව සඳහා එහි සතර දිසාවට මුහුණලා ඉදිකර ඇති අලංකාර කලා අංගය වනුයේ

1) පේසා වළලු ය 2) කොත් කැරැල්ල ය
3) වාහල්කඩ ය 4) සලපතල මළුව ය

23) ලංකාවේ ඉදිවූ ප්‍රථම දාගැබ ලෙස සලකනු ලබන්නේ

1) රුවන්වැලි මහා සෑයයි 2) අභයගිරියයි
3) ජේතවනාරාමයයි 4) ථූපාරාමයයි

24) හතරැස් කොටුවේ සෑම මුහුණතකම අට පෙති නෙළුම් මල් දක්නට ලැබෙන චෛත්‍යය වනුයේ

1) රන්කොත් වෙහෙර ය 2) අභයගිරිය ය
3) කැලණි විහාරය ය 4) රුවන්වැලි මහා සෑය ය

25) කහ වර්ණයට සමානුපාතිකව රතු වර්ණය එකතු කිරීමෙන් සෑදෙන වර්ණය වන්නේ

1) කොළ පාට 2) තැඹිලි පාට 3) දම් පාට 4) නිල් පාට

**✶ ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා අසා ඇති ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුරු ලියන්න.**

26) හින්දු කෝවිලට ඇතුලුවන දොරටුව ඉහළින් ........................................ නැමැති ගෘහ නිර්මාණ අංගය දක්නට ලැබේ.

27) ........................................ ක්‍රමයට ඉදිවූ ක්‍රිස්තියානු දේවස්ථානවල උල් වූ තුඩු සහිත ආරුක්කු දක්නට ලැබේ.

28) ........................................ රූකඩ ප්‍රදර්ශනය කිරීම සඳහා අඳුර හා ආලෝකය අත්‍යවශ්‍ය වේ.

29) අපතේ යන රෙදි කැබලි වර්ණ කොළ පිදුරු ආදිය අලවා නිර්මාණය කරන චිත්‍ර ................................ චිත්‍ර යනුවෙන් හැඳින්වේ.

30) ........................................ මාධ්‍ය මගින් චිත්‍රයක් විනිවිද පෙනෙන අයුරින් වර්ණ කළ හැකිය.

## II කොටස

**✶ පහත දී ඇති මාතෘකාවලින් එකක් තෝරා ගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.**

1) ආගමික ස්ථානයක වන්දනා කරන පිරිසක්
2) ගඟක දිය නාන ළමුන්
3) නගරයේ වෙළඳපොලක්
4) වැසි දිනක්
5) කොළ මල් යොදගෙන ව්‍යාප්ත මෝස්තරයක්
6) ළමා පොත් පිටකවරයක්
7) සත්ව රූප ඇසුරෙන් ව්‍යාප්ත මෝස්තරයක්